# පාරම්පරික කුඹල් කර්මාන්තයට උරුමකම් කියන නියංගම ආශ්‍රිතව සිදුකළ අධ්‍යයනය තුළින් කෙරෙන අනාවරණයකි

යූ.එල්.ටී.එස්. රන්දීප

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
tharushehan99@gmail.com

**මුඛ්‍ය පද** - මැටි බඳුන්, සාම්ප්‍රදායික, කුඹල් කර්මාන්තය, නියංගම ග්‍රාමය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට නූතන අවධිය දක්වාම මිනිසුන් අතර පවතින සංස්කෘතික චර්යාවල අඛණ්ඩතා හා වෙනස්කම් මැටිබඳුන් මඟින් පිළිබිඹු කරයි. මෙහි ආරම්භය පිළිබඳ සඳහන් කිරීමේදී නවශිලා යුගයේ දී ඇතිවන තාක්ෂණයේ සීඝ්‍ර දියුණුව ශාක හා සත්ත්ව ගෘහාශ්‍රිතකරණය පුළුල් වන අතිරික්තය ගබඩා කිරීමේ අවශ්‍යතාවය පැනනැඟිණි. මෙම අවශ්‍යතාවය මත මැටි භාණ්ඩ නිෂ්පාදනය ආරම්භ විය. මෙසේ මානවයා ශිෂ්ටාචාරගත වීමත් සමඟ බද්ධ කුඹල් කර්මාන්තය මානව ඉතිහාසයේ වර්ධනීය තාක්‍ෂණික අංගයක් ලෙස හඳුනාගැනීම නිවැරදිය. ලංකාවේ සංස්කෘතිය හා විවිධාකාරයෙන් බද්ධ වී ඇති මෙම මැටි භාජන විවිධ අරමුණු වෙනුවෙන් අඩුම තරමින් මීට අවුරුදු 5000කට එපිට කාලයේ සිට ලංකාවේ භාවිත වන්නට ඇති බවට පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වාර්තා සනාථ කරයි. යාපනය, කන්තරෝඩය, අනුරාධපුර, පොළොන්නරුව සහ මහනුවර ආදී ස්ථානවල කරන ලද කැණීම් ඊට සාධක සපයයි. සුලභව සපයා ගත හැකි අමුද්‍රව්‍යයක් නිසාත්, සාදා ගැනීමේ පහසුව නිසාත්, අවශ්‍යතාවේ ප්‍රමුඛතාව නිසාත් සෑම පුරාණ සමාජයකම පාහේ මැටි අමුද්‍රව්‍යයක් ලෙස භාවිතයට ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාරම්පරික මැටි කර්මාන්තයට උරුමකම් කියන නියංගම ආශ්‍රිතව සිදුකළ අධ්‍යයනය තුළින් කෙරෙන අනාවරණයකි.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා පාදක කරගත් ප්‍රධාන ක්‍රමවේදය වන්නේ ක්ෂේත්‍රයට ගොස් ගවේෂණයයි. එහිදී නියංගම ග්‍රාමය ආශ්‍රිතව සංචාරය කොට ඒ පිළිබඳව අධ්‍යනය කළ අතර ක්ෂේත්‍රයේදී සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ද සිදුකරන ලදී. එමෙන්ම මෙම ස්ථානයට පිවිසීමට ප්‍රථම සාම්ප්‍රදායික කුඹල් කර්මාන්තය හා සම්බන්ධව ලියැවී ඇති ග්‍රන්ථ සහ අන්තර්ජාල තොරතුරු ද පරිශීලනය කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නියංගම ග්‍රාමය පිහිටා ඇත. රත්නපුර නගරය පසු කොට ඇඹිලිපිටිය දක්වා දිවෙන මහා මාර්ගයේ ගොඩකවෙල නගරයෙන් වමට හැරී කිලෝමීටර් තුනක් පමණ දුර ගිය විට මෙම ග්‍රාමය හමුවේ. මෙම ග්‍රාමය සාම්ප්‍රදායික මැටි කර්මාන්තයේ නියැළෙන්නන් දැකිය හැකි ය. මූලාශ්‍රගත තොරතුරු නොමැති වුව ද ජනශ්‍රැති තොරතුරු තුළින් ඈත අතීතයේ සිට ම මෙම ගම්මානය තුළ කර්මාන්තයක් වශයෙන් කුඹල් කර්මාන්තය පැවත එන බව පවසයි. වර්තමානය වන විට නියංගම ජනතාව තම ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස කෘෂිකර්මාන්තය සිදු කරන අතර සුළුතරයක් කුඹල් කර්මාන්තයේ නියැළී සිටී.

මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී මැටිවල භෞතික හා රසායනික සංයුතිය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන්නකි. තද බව වර්ණ කැට සහිත බව ආදී ලක්ෂණ අනුව මෙන්ම එහි අන්තර්ගත ඛණිජ කොටස් අනුව ද මැටි වර්ග කෙරේ. ලංකාවේ සෑම පළාතකම පාහේ කෙයොලින්, මැටි, රතු මැටි සහ කහ පැහැති මැටි ද භාවිතා කොට තිබේ. නියංගම ජනයා තම නිෂ්පාදන සඳහා මැටි ලබා ගන්නේ යාබදව ඇති කුඹුරු මගිනි. එසේ ගෙනැවිත් ඉන්

පසු මැටි පදම් කර ගැනීම සිදුවේ. මේ සඳහා සාම්ප්‍රදායිකව සිදු කෙරෙන මැටි දෙපයින් පාගා පදම් කරගැනීමේ ක්‍රමය භාවිතා කරනු ලබයි. මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා භවිත කරන මෙවලම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී අත් සකපෝරුව බඳුන් හැඩ ගැන්වීමට යොදා ගන්නා දැවයෙන් තැනූ පත්ත සහ වෘත්තාකාර ගල මෙන්ම සකපෝරුව ද මොවුන් භාවිත කරන උපකරණ අතර ප්‍රධාන වේ. සකපෝරුව මත මැටි පිඬ තබා කරකවමින් අවශ්‍ය හැඩ ලබා ගනී. ඉන් පසු මෙසේ නිර්මාණය කරන මැටි භාණ්ඩ නූලක ආධාරයෙන් කපා ඉවත්කරගනු ලබයි. ඒවා මදක් වියළුණු පසු ඔප මට්ටම් කරගත් වෘත්තාකාර කළුගල සහ දැවයෙන් සෑදූ පත්ත ආධාරයෙන් මෙම භාණ්ඩවල යට කොටස (පතුල) සාදාගනු ලැබේ.

ප්‍රාරම්භක අවධියේ දී සමාජය තුළ මැටි බඳුන් විශාල ප්‍රමාණයක් එකවර පුළුස්සා ගැනීමක් සිදුවන්නේ නැත. එනම් එයට සරිලන තාක්‍ෂණයක් එකල නොපැවතිණි. එම නිසා දෛනික අවශ්‍යතාවන්ට පමණක් මැටි බඳුන් නිපදවා පුළුස්සා ගැනීම සිදුකර ඇත. නියංගම වැසියා මැටි බඳුන් පිළිස්සීම සඳහා යොදා යන්නා තාක්ෂණය විමසීමේ දී පළමුව පෝරණුව තුළ මැටි බදුන් හට්ටි ගැසීමක් සිදුවේ. පසුව විවරයක් තබා පිදුරු සහ මැටි ආධාරයෙන් පිළිස්සීමට අවශ්‍යය මැටි බඳුන් සම්පූර්ණයෙන්ම වැසීම සිදු කරයි. පැය 12-24 ක් අතර කාලයක් තුළ දර සහ දහයියා ආධාරයෙන් පුළුස්සා ගැනීමෙන් පසු උඩ තිබෙන මැටි තට්ටුව කඩා ඉවත් කර මැටි භාජන ඉවතට ගනියි. නියංගම කුඹලුන් බොහොමයක් නිපදවනු ලබන්නේ ගෘහාශ්‍රිත භාණ්ඩ වේ. ඒ අතර කලය, මුට්ටිය, ඇතිලිය, නැඹිලිය, මූඩිය, තැටි වර්ග, කොරහ, බත් වළඳ, මැටි කෝප්පය, ගුරුලේත්තුව සහ උඳුන් ද නිර්මාණය කරයි.

පරිසරය හා මිනිසා අතර පවතින්නේ අත්‍යන්තයෙන් බැඳුණු සංකීර්ණ සබඳතාවයකි. අතීත මිනිසා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට නව ශිලා යුගයට පරිවර්තනය වීමේ සංකීර්ණ වූ තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීමට දැරූ උත්සහයේ ප්‍රතිඵලයක් වශයෙන් නොයෙකුත් නිෂ්පාදන බිහි කිරීමට සමත් විය. ඒ අතර සුවිශේෂී නිමවුමක් ලෙස මැටි බඳුන් හදුනාගත හැකිය. මේ අනුව නියංගම ග්‍රාමයෙහි ඇති සාම්ප්‍රදායික කුඹල් කර්මාන්තය වර්තමානය වන විට පවුල් දහයකට පමණ සීමා වී හමාරය. වර්තමානය වන විට සාම්ප්‍රදායික කුඹල් කර්මාන්තය මුහුණපා ඇති අර්බුදතා හමුවේ මෙම කර්මාන්තය කෙසේ හෝ ඉදිරියට කරගෙන යාම සඳහා දරන ප්‍රයත්නය අගය කළ යුත්තකි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

මැන්දිස් ඩී. ටී., (2017). ***පුරාණ මැටි බඳුන් නිර්මාණ තාක්‍ෂණය හා ජේතවන විහාරය ආශ්‍රීත ව හමුවන මැටි බඳුන් වර්ගීකරණය***, ගැටඹේ: නෙත්වින් ප්‍රින්ටර්ස්.

ජයසිංහ පී. (2020). ***පුරාණයේ සිට මැටිවලින් වැඩගත් අපේ මිනිස්සු,*** පාදුක්කඃ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.